# 7 සේවා නියුක්තිය

## 7.1 සමස්ථ නිරීක්ෂණය

1995 වර්ෂයේදී ආර්ථිකය සියයට 5.5 කින් වර්ධනය වූ අතර වර්ෂය තුළ නව රැකියා අවස්ථා 80,000 ත් 90,000 ත් අතර ප්‍රමාණයක් උත්පාදනය වුනි. 1994 වර්ෂයේ රැකියා උත්පාදනය 89,000 ක් විය. සේවා නියුක්තියේ වර්ධනයට රාජ්‍ය සහ පෞද්ගලික යන අංශ දෙකම දායක වූ අතර රාජ්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්ති හේතුකොටගෙන, අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තියෙන් කොටසක් පෞද්ගලික අංශයට මාරු වුනි. වර්ෂය තුළදී උත්පාදනය වූ නව රැකියා අවස්ථා වලින් තුනෙන් එකක් පමණ ලබාදීමට ආයෝජන මණ්ඩලය සමත් විය.

1995 වසර තුළදී උදාවූ නව රැකියා අවස්ථාවන් නිසා ශ්‍රම බලකායට අලුතෙන් එකතු වූ පිරිසෙන් සියයට 60 කට පමණ රැකියා ලබාදීමට හැකි විය. ලැබී ඇති තොරතුරුවලට අනුව සේවා වියුක්ති අනුපාතය 1995 වර්ෂය තුළදී සියයට 12-13 අතර පැවතුන බවට ඇස්තමේන්තු කොට ඇත. පිටරට රැකියාවන් සඳහා විදේශගත වීම වැඩිවීමද, ශ්‍රම වෙළෙඳපොලෙහි දැඩි පීඩනයන් අඩුකරලීමට සමත් විය.

පෞද්ගලික සේවාවන් සහ වෙළඳ සහ හෝටල් අංශය හැර අනෙකුත් සෑම ප්‍රධාන අංශයක්ම 1995 වර්ෂයේදී සේවා නියුක්තියේ වර්ධනයට දායක විය. 1994 වර්ෂයේ වාර්තා වූ අඩුවීමට ප්‍රතිවිරුද්ධව යමින්, කෘෂිකාර්මික, සත්ව පාලන සහ ධීවර අංශයේ සේවා නියුක්තිය සියයට 7 කින් වැඩි විය. 1994 වර්ෂයේ නිමැවුම් කර්මාන්ත අංශයේ සේවා නියුක්තියෙහි ඇති වූ සියයට 4 ක මධ්‍යස්ථ වර්ධනය හා සසඳන විට මෙම වර්ෂයේදී එම අංශයේ සේවා නියුක්තිය සියයට 12 කින් වැඩිවුනි. පෞද්ගලික සේවා අංශයේ රැකියා උත්පාදනය සියයට 12 කින් අඩු වූ අතර, ශ්‍රමිකයන් එම අංශයේ සිට, වඩාත් පිඩිමත් අංශ වල රැකියා කරා යොමුවීම මෙයට හේතු වන්නට ඇත.

## 7.2 රාජ්‍ය අංශය

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වන ලද රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ වාර්ෂික සමීක්ෂණයට අනුව, රාජ්‍ය ආයතන හා අර්ධ රාජ්‍ය ආයතන වලින් සමන්විත වූ, රාජ්‍ය අංශයේ සේවා නියුක්ති සංඛ්‍යාව, 1995 වර්ෂය අවසාන වන විට දශලක්ෂ 1.3 ක්ව පැවති බව ඇස්තමේන්තු කොට ඇත. මෙය, පසුගිය වර්ෂය හා සසඳන විට සියයට 1.4 ක සුළු අඩුවීමකි. මෙය පසුගිය දෙවර්ෂයෙහි පැවති මෙම අංශයේ සේවා නියුක්තිය වැඩිවීමේ ප්‍රවණතාවයට ප්‍රතිවිරුද්ධ තත්ත්වයකි. මෙම අඩුවීමට බලපෑ හේතුව වූයේ අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයන්ගේ සංඛ්‍යාව සියයට 8.9 කින් අඩු වීමයි. ප්‍රධාන වැවිලි සමාගම් තුනක් දිගුකාලීන බදු ගිවිසුම් යටතේ පෞද්ගලික අංශයට පවරා දීම සහ රාජ්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්තීන්, අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය අඩු වීමට හේතු විය. කෙසේ වුවත්, පසුගිය වර්ෂ කිහිපයේ පැවති උපනතියට අනුව යමින්, මධ්‍යම රජය, පළාත් සභා සහ පලාත්පාලන ආයතන වලින් සමන්විත රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය තවදුරටත් ප්‍රසාරනය වෙමින් සියයට 5.4 කින් වර්ධනය වුනි. රාජ්‍ය අංශයේ සේවා නියුක්තියෙහි වූ මෙම වර්ධනය, ප්‍රධාන වශයෙන් පිළිබිඹු වූයේ ලිපිකරු හා ඊට සම්බන්ධ සේවා නියුක්ත කාණ්ඩයේ වැඩිවීම මගිනි. සමෘද්ධි වැඩසටහන යටතේ සමෘද්ධි නියාමකවරුන් හා සමෘද්ධි නියාමක කළමණාකරුවන් පත්කිරීම එම කාණ්ඩයේ විශාල වැඩිවීමට හේතු විය. වෘත්තිය, ශිල්පීය හා ඊට සම්බන්ධ සේවක කාණ්ඩයන්හිද පසුගිය වර්ෂය හා සසඳන විට සියයට 2 ක සුළු වැඩිවීමක් වාර්තා වූ අතර, එයට ප්‍රධාන වශයෙන් බලපෑවේ සෞඛ්‍ය උප අංශයේ ඇති වූ වැඩිවීමයි. පසුගිය වර්ෂ කිහිපය තුළ පැවති ප්‍රවනතාවයට අනුව යමින් 1995 වර්ෂයේදී ද සේවා අංශයේ සේවා නියුක්තිය අඛණ්ඩව වර්ධනය විය.

සංඛ්‍යා සටහන 7.1

**ශ්‍රම බලකාය සහ සේවා නියුක්තිය**

| | පුද්ගලයන් දශලක්ෂ | | | | | වෙනස්වීමේ ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|---|
| | 1991 | 1992 | 1993 | 1994 | 1995 | 1994 | 1995 |
| මුළු ජනගහනය | 17.247 | 17.405 | 17.619 | 17.865 | 18.144 | 1.4 | 1.4 |
| අවු. 10 සහ ඊට වැඩි ජනගහනය | 11.947 | 12.154 | 12.251 | 12.559 | 12.764[1] | 2.5 | ලැ.නො. |
| ශ්‍රම බලකාය | 5.894 | 5.948 | 6.066 | 6.046 | 6.115[1] | -0.3 | ලැ.නො. |
| සේවා නියුක්තිය | 5.084 | 5.159 | 5.227 | 5.315 | 5.339[1] | 1.7 | ලැ.නො. |
| රාජ්‍ය අංශය | 1.307 | 1.291 | 1.295 | 1.325 | 1.307 | 2.3 | -1.4 |
| මධ්‍යම රජය | 0.653 | 0.654 | 0.676 | 0.700 | 0.738 | 3.5 | 5.4 |
| අර්ධ රාජ්‍ය අංශය | 0.654 | 0.637 | 0.619 | 0.625 | 0.569 | 1.0 | -8.9 |
| පෞද්ගලික අංශය | 3.777 | 3.868 | 3.931 | 3.990 | ලැ.නො. | 1.5 | ලැ.නො. |
| ආයෝජන මණ්ඩලය | 0.085 | 0.104 | 0.180 | 0.206 | 0.233 | 14.3 | 13.5 |
| අනෙකුත් | 3.691 | 3.764 | 3.751 | ලැ.නො. | ලැ.නො. | 0.9 | ලැ.නො. |
| සේවා වියුක්තිය | 0.810 | 0.789 | 0.839 | 0.731 | 0.786[1] | -12.9 | ලැ.නො. |
| ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය (%) | 49.3 | 48.9 | 49.5 | 48.1 | 47.9[1] | | |
| විරැකියා අනුපාතය (%) | 13.8 | 13.3 | 13.8 | 12.1 | 12.7[1] | | |

[1] ශ්‍රම බලකාය පිළිබඳ ත්‍රෛමාසික සමීක්ෂණය 1995 3 කාර්තුව.

මූලයයන් : ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**7.1 රූපසටහන**
**සේවා නියුක්තියේ ආංශික සංයුතිය 1990 - 1995**




## 7.3 ආංශීය සේවා නියුක්තිය

පසුගිය වර්ෂ කිහිපය තුලදී සේවා, නිමැවුම් කර්මාන්ත සහ ඉදිරිකිරිම් යන අංශවල සේවා නියුක්තියේ සාපේක්ෂ දායකත්වයෙහි වැඩිවීමේ ප්‍රවණතාවක් පිළිබිඹු කරමින් කෘෂිකාර්මික අංශයේ සේවා නියුක්ති දායකත්වයේ ක්‍රමික අඩුවීමක් වාර්තා විය. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ශ්‍රම බලකාය පිළිබඳව ත්‍රෛමාසික සමීක්ෂණයට අනුව, 1990-1994 කාලපරිච්ඡේදය තුළ සේවා නියුක්තියේ ආංශිය වර්ගීකරණයේ ව්‍යුහාත්මක වෙනස්වීමක් පෙන්නුම් කෙරුනි. 1990 වර්ෂයේදී මුළු ශ්‍රම බලකායෙන් කෘෂිකාර්මික අංශයේ නියුතු වූ ප්‍රමාණය සියයට 45 ක් විය. මෙම අනුපාතය, දළ දේශීය නිෂ්පාදිතයට කෘෂිකාර්මික අංශයෙන් සිදු වූ හීනවන දායකත්වය පෙන්නුම් කරමින් 1994 වනවිට සියයට 34 දක්වා අඩු විය. කෘෂිකාර්මික අංශයෙහි වූ අඩු වර්ධන වේගයත්, නිමැවුම් කර්මාන්ත සහ සේවා අංශවල රැකියාවන් සඳහා ඇති බොහෝ ඉඩකඩ සමග සසඳා බලන විට කෘෂිකාර්මික අංශයේ රැකියා සඳහා ඇති එවැනි ඉඩකඩ අඩුවීමත්, මෙම අංශයේ දායකත්වය අඩුවීමට බොහෝදුරට හේතු විය. එමෙන්ම ස්ථාවර ආදායමක් ලබා ගැනීමේ මාර්ගයක් වශයෙන් මෙම අංශයේ පවතින අවිනිශ්චිතතාවයද, මෙම අංශයේ සේවා නියුක්තියේ දායකත්වය ක්‍රමිකව අඩු වීමට තවත් හේතුවක් විය. මුළු සේවා නියුක්තියෙන් කෘෂි අංශයේ නියුතු සේවා සංඛ්‍යාව අඩුවීමේ ප්‍රවණතාවය 1995 වර්ෂයේදී තරමක්දුරට වෙනස්වූ අතර, 1994 වර්ෂය හා සසඳන විට කෘෂිකාර්මික අංශයේ නියුතු සේවකයන් සංඛ්‍යාවෙහි සියයට 7

**සංඛ්‍යා සටහන 7.2**

**ශ්‍රම බලකාය සහ සේවා නියුක්තිය 1990 - 1995* (තෙවන කාර්තුව)**

(පුද්ගලයන් දශ ලක්ෂ)

| | 1990 | 1993 | 1994 | 1995 |
|---|---|---|---|---|
| ගෘහස්ථ ජනගහනය (අවු. 10 ට වැඩි) | 11.633 | 12.284 | 12.479 | 12.763 |
| ශ්‍රම බලකාය | 6.085 | 6.032 | 6.142 | 6.115 |
| මුළු සේවා නියුක්තිය | 5.159 | 5.249 | 5.299 | 5.339 |
| ආර්ථික අංශ අනුව | | | | |
| කෘෂිකාර්මික, සත්වපාලන සහ ධීවර | 2.307 | 2.293 | 1.833 | 1.967 |
| පතල් සහ කැනීම් | 0.090 | 0.066 | 0.032 | 0.092 |
| නිමැවුම් | 0.727 | 0.740 | 0.769 | 0.864 |
| විදුලිය, ගෑස් සහ ජලය | 0.038 | 0.023 | 0.025 | 0.012 |
| ඉදිකිරීම | 0.164 | 0.171 | 0.260 | 0.270 |
| වෙළඳ සහ හෝටල් | 0.500 | 0.636 | 0.643 | 0.601 |
| ගමනාගමනය, ගබඩා පහසුකම් සහ පණිවුඩ හුවමාරු | 0.221 | 0.223 | 0.296 | 0.237 |
| රක්ෂනය සහ නිශ්චල දේපල | 0.079 | 0.081 | 0.061 | 0.072 |
| පෞද්ගලික සේවාවන් | 0.851 | 0.776 | 1.080 | 0.952 |
| අනෙකුත් (අන්තැනක සඳහන් නොකළ) | 0.180 | 0.238 | 0.299 | 0.272 |

* උතුරු සහ නැගෙනහිර පළාත් හැර

මූලයයන් : ශ්‍රම බලකාය පිළිබඳ ත්‍රෛමාසික සමීක්ෂණය
ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ක වැඩිවීමක් වාර්තා කරමින්, මුළු සේවා නියුක්ති සංඛ්‍යාවෙහි කෘෂිකාර්මික අංශයේ දායකත්වය සියයට 37 දක්වා වැඩි විය.

පසුගිය වර්ෂ කිහිපය තුල සේවා අංශයේ රැකියා උත්පාදනයෙහි වැඩිවීමේ උපනතියක් පෙන්නුම් කෙරුනි. 1990 දී සියයට 36 ක්ව පැවති මුළු සේවා නියුක්තියෙන් සේවා අංශයේ වූ දායකත්වය, 1994 දී සියයට 45 ක් දක්වා වැඩිවිය. සේවා අංශය තුළ සේවා නියුක්තියේ වර්ධනයක් බොහෝදුරට පිළිබිඹු වූයේ වෙළඳ සහ හෝටල් සේවා, ගමනාගමනය, පණිවුඩ හුවමාරුව සහ පෞද්ගලික සේවාවන් යන අංශයන්හිය. පසුගිය වර්ෂ කිහිපය තුළ දළ දේශීය නිෂ්පාදිතයට මෙම අංශයෙන් වූ දායකත්වයේ මෙවැනිම වැඩිවීමක් දැකිය හැකිවිය. කෙසේ වුවද, මුළු සේවා නියුක්තියට සේවා අංශයෙන් වූ දායකත්වය 1995 වර්ෂයේදී සියයට 40 දක්වා අඩු වූ අතර මෙම අඩුවීම රක්ෂණ සහ නිශ්චල දේපල යන අංශයන් හැරුණකොට සේවා අංශයෙහි අනෙකුත් සියළුම උප අංශ මගින් පිළිබිඹු වුණි.

නිමැවුම් කර්මාන්ත අංශයෙන් මුළු සේවා නියුක්තිය සඳහා 1994 දී සියයට 14 ක් වූ දායකත්වය 1995 දී සියයට 16 දක්වා වැඩි විය. මෙමගින් රැකියා උත්පාදනය කිරීමේ ප්‍රධාන මූලාශ්‍රයන්ගෙන් එකක් ලෙස එම අංශයේ වැදගත්කම පිළිබිඹු කෙරුනි. මෙම වැඩිවීමට බොහෝදුරට හේතු වූයේ ඇඟළුම් කර්මාන්තයන්හි රැකියා අවස්ථා වැඩිවීමත්, විදේශ ආයෝජනයන්හි නොකඩවා වූ වැඩිවීමත්ය.

සංවිධිත පෞද්ගලික අංශයේ සේවා නියුක්තිය පිළිබඳ වාර්ෂික දත්ත නොමැති බැවින්, සේවා නියුක්තිය තක්සේරු කිරීම සඳහා අර්ථසාධක අරමුදලෙහි ලියාපදිංචි සේවක සංඛ්‍යාව වැනි වෙනත් දර්ශක යොදාගෙන ඇත. 1995 වර්ෂයේ ඇතිවූ සතුටුදායක ආර්ථික වර්ධනය පිළිබිඹු කරමින්, පසුගිය වර්ෂ කිහිපය තුළ සේවා නියුක්තියෙහි දක්නට තිබූ වැඩිවීමේ උපනතිය මෙම වර්ෂයේද තවදුරටත් පැවතෙනු ඇතැයි අපේක්ෂා කළ හැකිය.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන ව්‍යවසායයන් මගින් වූ රැකියා උත්පාදනය 1995 වර්ෂයේදී තවදුරටත් වැඩිවුනි. 1995 වර්ෂය තුලදී මෙම ව්‍යවසායයන්, පුද්ගලයන් 233,000 ක් සඳහා රැකියා සැපයූ අතර, මෙය පසුගිය වර්ෂය සමග සසඳන විට සියයට 14 ක වැඩිවීමකි. මෙම වැඩිවීමෙන් සියයට 85 කට ආසන්න සංඛ්‍යාවකට රැකියා සැපයුනේ රසායනික නිෂ්පාදන, ආහාරපාන වර්ග හා දුම්කොළ රෙදිපිළි හා ඇඟළුම් වැනි කර්මාන්ත සහ සේවා අංශයන්ගෙනි. මෙම සේවා නියුතු සංඛ්‍යාවෙන් සියයට 38 ක් පමණ කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපයෙහි විය. බියගම සහ කොග්ගල ආයෝජන ප්‍රවර්ධන කලාපයන්හි රැකියාවන් උත්පාදනය, පිළිවෙලින් සියයට 15 ක් සහ සියයට 3 ක් විය.

අවිධිමත් අංශයේ සේවා නියුක්ති තත්ත්වය පිළිබඳව සලකා බැලීමේදී දිළිඳුකම පිටුදැකීමේ වැඩපිළිවෙලවල් යටතේ ඇති කරන ලද ස්වයං රැකියා ප්‍රමාණය ප්‍රයෝජනවත් දර්ශකයක් වේ. කෘෂිකාර්මික අංශය හැරුන විට අනෙකුත් සියළුම අංශවල ස්වයං රැකියාවන්හි නියැලුණු සේවක සංඛ්‍යාව වැඩිවීමේ උපනතියක් පිළිබිඹු කෙරුණ අතර, මෙම වැඩිවීම විශේෂයෙන්ම පෙන්නුම් කරන ලද්දේ වෙළඳ හා හෝටල් අංශයේ සහ පෞද්ගලික සේවාවන්හිය. රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන වලින් ලැබුණ අනුග්‍රහයන් යටතේ ණය පහසුකම් සැපයීම, පුහුණු කිරීමේ කටයුතු වැඩිදියුණු කිරීම සහ අලෙවි කිරීමේ පහසුකම් ඇති කිරීම, ස්වයං රැකියා අවස්ථා වැඩිවීමට මූලික වශයෙන් දායක විය. 1995 වර්ෂය තුළ ජාතික සංවර්ධන අරමුදල මගින් සුළු පරිමාණයේ ස්වයං රැකියා ව්‍යාපෘති 38,713 ක් සඳහා, රුපියල් දශලක්ෂ 332 ක් ලබා දුනි.

## 7.4 විදේශ රැකියාවන්

විදේශ රැකියාවන් රටෙහි සේවා වියුක්තිය අඩුකරලීමට තවදුරටත් උපකාරී විය. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් රැස්කර ඇති තොරතුරුලට අනුව 1995 වර්ෂය තුළ පුද්ගලයන් 170,131 ක් සඳහා විදේශ රැකියා අවස්ථා සැලසුනි. 1994 වර්ෂය හා සසඳන විට මෙය සියයට 5.2 ක වැඩිවීමකි. විදේශ රැකියාවන්වලදී වැඩිම ඉල්ලුමක් පැවතුනේ නුපුහුණු සේවකයන් සඳහාය. මෙයින් වැඩි කොටසක්, එනම් සියයට 66 ක් පමණ සේවිකාවන් සඳහා විය. විශේෂයෙන්ම ගෘහ සේවිකාවන් සඳහා සිංගප්පූරුව, මාලදිවයින සහ ඉතාලිය වැනි, මැදපෙරදිග නොවන රටවලින් වැඩි ඉල්ලුමක් පැවති බව දත්ත වලින් හෙළි විය. කෙසේ වුවද, මැදපෙරදිග රටවල වැටුප් දිගු කාලයක් තිස්සේ නොවෙනස්ව පැවතියදීත්, රැකියාවන් සඳහා වූ ඉල්ලුමෙන් වැඩිම කොටසක් එනම් සියයට 92 ක් පමණ ඇති වූයේ එම රටවලිනි.

වේගවත් ආර්ථික සංවර්ධනයක් පෙන්නුම් කරන, දකුණු කොරියාව සහ සිංගප්පූරුව වැනි ආසියාතික රටවලින් නව රැකියා අවස්ථාවන් උදා විය. විදේශ රැකියා, රටට විදේශ විනිමය ඉපයීමේ ප්‍රධාන මූලාශ්‍රයක් වන නිසාත්, දේශීය සේවා වියුක්තිය අඩු කිරීමට හේතුවන නිසාත් විදේශ රැකියා සඳහා පිටත්ව යන පුද්ගලයන් සඳහා රජය විසින් සපයන පහසුකම් වැඩි දියුණු කිරීමටත්, එම පහසුකම් පුළුල් කිරීමටත් තවදුරටත් පියවර ගෙන ඇත.